# ශ්‍රී ලංකාවේ තරුණයින්ගේ හෙරොයින් ඇබ්බැහිය කෙරෙහි පවුල් සංස්ථාවේ බලපෑම පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

බන්ධනාගාර සහ පුනරුත්තාපන ආයතන ඇසුරින්.

# A Sociological Study of the Role of Family in Heroin Addiction in Sri Lanka

LIBRARY
2003-7-22
UNIVERSITY OF PERADENIYA

UNIVERSITY OF PERADENIYA
25 JUL 2002
ASSISTANT REGISTRAR
FACULTY OF ARTS

ඩබ්ලිව්.එම්.යූ. වීරකෝන්

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

මෙම ස්වාධීන නිබන්ධනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

2002

562631

# සාරාංශය

මෙම නිබන්ධනයෙන් ශ්‍රී ලංකාවේ තරුණ පිරිමි ළමයින්ගේ හෙරොයින් මත්ද්‍රව්‍ය ඇබ්බැහිය කෙරෙහි පවුල් සංස්ථාවේ බලපෑම අධ්‍යයනය කෙරිණි. අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස වැලිකඩ හා බෝගම්බර යන බන්ධනාගාර දෙකත්, පල්ලේකැලේ එළිමහන් සිර කඳවුර හා එම එළිමහන් කඳවුර අනුබද්ධිතව පිහිටුවා ඇති නවෝදාව හෙරොයින් පුනරුත්ථාපන මධ්‍යස්ථානයත් යොදා ගැනුණි. අධ්‍යයන නියැදිය ලෙස හෙරොයින් පානයට ඇබ්බැහිව සිටි මත්ද්‍රව්‍ය හෝ වෙනත් වරදක් සම්බන්ධයෙන් උසාවියෙන් වරදකරුවන් බවට පත්වී මෙම ආයතන වල දඩුවම් ලබන්නන් යොදා ගැනුණි.

අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීමේදී ප්‍රත්‍යෙක අධ්‍යයන (Case Studies) ක්‍රමය භාවිතා කෙරිණි. අදාල ආයතනවල සිටි හෙරොයින් හා සම්බන්ධ වරදකරුවන් මුලදී හඳුනාගත් අතර, ඉන් පසුව ඔවුන් අතුරින් 25 දෙනෙකු ප්‍රත්‍යෙක අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලදී. මෙසේ තෝරාගනු ලැබුවේ හෙරොයින් ඇබ්බැහිය කෙරෙහි පවුලේ බලපෑම වඩාත් හොඳින් පැහැදිලි වූ පුද්ගලයන්ය. අදාල පුද්ගලයන් 25 දෙනා පිළිබඳව උක්ත ආයතන සතුව පැවති ලිපිගොනු ඇසුරින් මූලික තොරතුරු ලබාගත් අතර, ඉන් අනතුරුව එම පුද්ගලයන් අවස්ථා කිහිපයකදී හමුවී ගැඹුරු සාකච්ජා මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. එම ප්‍රත්‍යෙක අධ්‍යයන සඳහා අවිවාහක, වයස අවුරුදු 25–35 අතරට ඇතුලත් වූ 25 දෙනා අතුරෙන් පවුලේ බලපෑම වඩාත් ඉස්මතු වූ පුද්ගලයන් 15 ක් පිළිබඳ තොරතුරු මෙම නිබන්ධනයේදී ඉදිරිපත් කරනු ලැබේ.

මෙම අධ්‍යයනයෙන් සොයාගත් මූලික කරුණක් නම් හෙරොයින් හා සම්බන්ධ වරදවල් වලට බන්ධනාගාර ගතවන හෝ පුනුරුත්තාපන ක්‍රියාවලියට පිවිසෙන තරුණ පිරිමින් බොහෝ දෙනෙක් නාගරික පහළ මධ්‍යම පාන්තික පසුබිමකින් පැවත එන බවයි. අදාල පුද්ගලයන්ගෙන් සැහෙන පිරිසක් බිඳුණු පවුල් වලින් හෝ මව තාවකාලික විදේශ ගත වූ පවුල් වලින් පැමිණීමද මෙහිදී සඳහන් කළයුතු කරුණකි. හෙරොයින් ඇබ්බැහියට වඩාත්ම යොමුවී ඇත්තේ පවුලේ බාලම පිරිමි ළමයා හෝ එකම පිරිමි ළමයාද වන බව සඳහන් කළ යුතුයි.

උක්ත පුද්ගලයන්ගේ හෙරොයින් ඇබ්බැහිය ගැන කරුණ විමසීමේදී පෙනී යන කරුණක් නම් ඔවුන් හෙරොයින් වලට යොමුවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන කරුණු දෙකක් පවතින බවයි. එකක් ඔවුන් පදිංචි හෝ ඔවුන් රැකියා කරන පරිසරයෙහි හෙරොයින් පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම. අනෙක උක්ත පුද්ගලයන් බොහෝ විට ඔවුන්ගේ පවුලේ ඇති අර්බුද නිසා කිසියම් චිත්තවේගී අර්බුදයකට මුහුණ පා සිටින විටදී එම අර්බුදයට පිළියමක් ලෙස හෙරොයින් භාවිතය හඳුනා ගනු ලැබීම. අදාල චිත්තවේගී අර්බුදයක් ලෙස මව පවුලෙන් වෙන්වී මැද පෙරදිග රැකියාවකට යාම, මව හා පියා අතර ඇති ගැටුම්කාරී තත්ත්වයන්, සහෝදර සහෝදරියන් සම්බන්ධ ප්‍රශ්න සහ පවුලේ ඇති ආර්ථික අර්බුද විශේෂයෙන් සඳහන් කළ යුතුයි. පහළ මධ්‍යම පාන්තික පන්ති පසුබිමකින් එන මෙම තරුණයන් බොහෝ විට අධ්‍යාපනය අතින් සහ අපේක්ෂිත රැකියා ලබා ගැනීම අතින් පරාජිත තත්ත්වයක පසුවන අතර එහිදී පත්වන මානසික අර්බුදයට පිළියමක් ලෙසද හෙරොයින් සලකන බව පෙනේ.

හෙරොයින් ඇබ්බැහිය සඳහා පවුලෙන් ඇති බලපෑම සැලකීමේදී අදාල පිරිමි ළමයාගේ පියාගෙන් හෝ සෙසු පිරිමි සහෝදරවරුන්ගෙන් ලැබෙන ආදර්ශයද විශේෂයෙන් වැදගත්වේ. පියා හෝ සෙසු පිරිමි සහෝදරයන් දුම්පානය හා මත්පැන් පානයට ඇබ්බැහි වී සිටීම මෙම අධ්‍යයනයට ලක්වූ ප්‍රත්‍යෙක අධ්‍යයන වලින් පැහැදිලි වන කරුණකි. පවුලේ බාලම පිරිමි ළමයා බොහෝ විට වැඩිහිටි පිරිමින් අනුකරණය කිරීමට පෙළෙඹෙන නමුත් ඔවුන් අනුව යමින් මත්පැනට හෝ දුම්බීමට ඇබ්බැහි වීමට වඩා තම වයස් කණ්ඩායමේ බලපෑම යටතේ හෙරොයින් පානයට ඇබ්බැහි වීමට වැඩි නැඹුරුවක් ඇති බව මෙම ප්‍රත්‍යෙක අධ්‍යයන වලින් හෙළිවේ.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් අනුව කළ හැකි එක් යෝජනාවක් නම් හෙරොයින් හා සම්බන්ධ වරදවලට දැනට පමුණුවන දඬුවම් ක්‍රමයේ වෙනසක් සිදුවිය යුතු බවයි. දැනට පවතින දඬුවම් ක්‍රමය හෙරොයින් වරදකරුවන් සමාජීය වශයෙන් හංවඩු ගැසීමට හේතුවන අතර ඔවුන් හෙරොයින් භාවිතයට තව දුරටත් ඇබ්බැහිවීම කෙරෙහි එය බලපාන බව පෙනීයයි. එපමණක් නොව හෙරොයින් වරදකරුවන් සහ සෙසු අපරාධකරුවන් බන්ධනාගාර තුළ එකට මිශ්‍රවීම තුළින් ඔවුන්ගේ අපචාරී නැඹුරුව වඩාත් තීව්‍ර වන බව පෙනීයයි. එබැවින් හෙරොයින් වරදකරුවන් බන්ධනාගාර ගත කරනවාට වඩා මේ සඳහා අවශ්‍ය පහසුකම් ඇති පුනුරුත්තාපන කඳවුරු වලට යැවීම වඩාත් ගෝචර වන බව පෙනීයයි. ශ්‍රී ලාංකික තරුණ පරපුර හෙරොයින් වලට ලක්වීම

වැළැක්වීම සඳහා ඉදිරිපත් කළ හැකි එක් යෝජනාවක් නම් හෙරොයින් තරුණ ප්‍රශ්න වලට විසඳුමක් නොව තරුණ ප්‍රශ්න තවදුරටත් තීව්‍ර කිරීමට හේතුවන කරුණක් බව, උදාහරණ ඇසුරින් තරුණ පරම්පරාවට පාසල් මට්ටමේ සිටම අවබෝධ කරවීම. මේ සඳහා ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවලටද ක්‍රියාත්මක ලෙස සහභාගී විය හැක. හෙරොයින් භාවිතයට බලපාන සමාජීය කරුණු පිළිබඳව තව දුරටත් පර්යේෂණ සිදුකළ යුතු අතර විවිධ ප්‍රතිකාර ක්‍රම කොතෙක් දුරට ඵලදායිද යන්න එම පර්යේෂණ වලදී වැඩි අවධානයට ලක්විය යුතුය.